සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැ 2 යි |

නම / பெயர் / Name ........................................................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

- **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**
- **දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.**

---

## I - කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

1. ලෝකයේ විශාලතම මහාද්වීපය ........................................ මහාද්වීපයයි.
   (අප්‍රිකා / යුරෝපා / ආසියා)

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න ................................ ක් ඇත.
   (80/ 103/ 120)

3. ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළින් රට තුළට පිවිසෙන බොහෝ වාසුළි ................................ දිග වෙරළින් පිටව යයි.
   (වයඹ / ගිණිකොන / නිරිත )

4. වැව් ආශ්‍රිතව බිහිවූ ගම්මාන දක්නට ලැබෙන්නේ ........................... කලාපයේය.
   (තෙත් / වියළි / නිරිත)

5. කඩොලාන ශාක බහුලව දක්නට ලැබෙන ප්‍රදේශයක් ලෙස ....................... හැඳින්විය හැකිය.
   (ආනවිලුන්දාව / හෝර්ටන්තැන්න / විල්පත්තුව)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි'' යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

6. යුරෝපය හා ආසියාව එක්ව සැලකූ විට යුරේසියාව නමින් හඳුන්වයි. නි / වැ

7. ස්වාධීන රටවල් හෙවත් රාජ්‍යයන් 54 ක් ආසියානු ප්‍රදේශයේ පිහිටා ඇත. නි / වැ

8. ලෝකයේ ගැඹුරුතම මිරිදිය විල බොල්කෑෂ් විලයි. නි / වැ

9. මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශ නිවර්තන මෝසම් දේශගුණයට අයත් වේ. නි / වැ

10. ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහන රටාව අරීය රටාවක් පෙන්නුම් කරයි. නි / වැ

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල භූ විෂමතා ලක්ෂණ ............................ රේඛා මගින් දක්වා ඇත.

12. ටොයෝටා, මිට්ෂුබිසි මෝටර් රථ නිපදවන රට .............................. යි.

13. රටක ජන සංඛ්‍යාවේ වයස අවුරුදු 15 න් ඉහළ පුද්ගලයන්ගේ අකුරු කියවීමට හා ලිවීමට ඇති හැකියාව .................. ලෙස හඳුන්වයි.

14. කිසියම් රටක නිශ්චිත කාල සීමාවක් තුළ ජාතික ආදායමෙන් එක් පුද්ගලයෙකුට අයත් කොටස ............................ ආදායම ලෙස හඳුන්වයි.

15. මොන්ට්‍රියල් සම්මුතිය .......................... ස්තරය ආරක්ෂා කිරීම අරමුණු කොට ගත් ජාත්‍යන්තර ක්‍රියාමාර්ගයකි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. කැස්පියන් මුහුදට ගලා බසින ගංගාවකි.
    1. යෙනිසි 2. යුරල් 3. හොවැංහෝ 4. අමුඩේරියා

17. ශ්‍රී ලංකාවේ ජන සංගණන පවත්වනු ලබන්නේ
    1. අවුරුදු 01 කට වරක් ය. 2. අවුරුදු 05 කට වරක් ය. 3. අවුරුදු 10 කට වරක් ය. 4. අවුරුදු 12 කට වරක් ය.

18. මුහුදෙන් වට වී ඇති කුඩා ගොඩබිම් ප්‍රදේශ හඳුන්වන්නේ කුමන නමින්ද?
    1. මුහුදු බොක්ක 2. තුඩුව 3. කලපුව 4. දූපත

19, "ලෝකයේ පියස්ස" නමින් හඳුන්වන්නේ
    1. ටිබෙට් සානුව යි. 2. ඩෙකෑන් සානුව යි. 3. පාමීර් සානුව යි. 4. ඉරාන සානුව යි.

20. ශ්‍රී ලංකාවේ ශේෂ කන්දකට උදාහරණයක් වන්නේ
    1. සීගිරිය ය. 2. නකල්ස් ය. 3. නමුණුකුල ය. 4. සමනල ය.


(ලකුණු 2×20 = 40)

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. අ. පහත දී ඇති ලෝක සිතියම් කොටස අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- නියමිත අක්ෂරය තෝරා අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.




i. බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය
A, B, C

ii. මුම්බායි නගරය දැක්වෙන අක්ෂරය
D, E, F

iii. කැස්පියන් මුහුද දැක්වෙන අක්ෂරය
G, H, J

iv. ටෝකියෝ නගරය දැක්වෙන අක්ෂරය
K, L, M

v. අරාබිය දැක්වෙන අක්ෂරය
N, O, P

(ලකුණු 10)

ආ. පහත සදහන් දෑ 1:50 000 හු ලක්ෂණ සිතියම් වල භාවිත කරන සංකේත හා වර්ණ භාවිත කරමින් ඇඳ දක්වන්න.

i. දිස්ත්‍රික්ක මායිම

ii. ක්‍රිස්තියානි පල්ලිය

iii. වී වගාව

iv. පුළුල් ඒකීය දුම්රිය මාර්ගය

v. පාසල

(ලකුණු 10)

02. i. පහත වරහන් තුළ දී ඇති ගංගා අතුරින් පැසිපික් සාගරයට ගලා බසින ගංගා දෙකක් තෝරා ලියන්න. (ඉරවඩි, හොවැංහෝ, බ්‍රහ්මපුත්‍ර, අමුර්) (ලකුණු 02)

ii. හිමාලය කඳු පද්ධතිය තුළ පිහිටි උස්කඳු ශිඛර තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. කේතුධර වනාන්තර වල වැවෙන ශාක වර්ග දෙකක් නම් කර, එම ශාකවල ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. කොකසොයිඩ් මානව වර්ගය වෙසෙන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පාකිස්ථානය ලෝක වෙළෙඳපොළට සපයන කෘෂි නිෂ්පාදන වර්ග තුනක් ලියන්න. (ලකුණු 03)


iii. සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි රාජ්‍යයේ ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. i. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ දක්නට ලැබෙන සානු වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. යාබද සිතියමේ 2,3,5 වශයෙන් දක්වා ඇති දේශගුණික කලාප තුන නම් කරන්න. (ලකුණු 03)

iii. (a) සිතියමේ අංක 1 න් දක්වා ඇති දේශගුණික කලාපය නම් කරන්න.

(b) එම දේශගුණික කලාපයේ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 05)




05. i. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම්වලට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

iii. (a) වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූ ලක්ෂණ දෙකක් නම් කරන්න.

(b) ඉන් එක් භූ ලක්ෂණයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

06. i. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යා ව්‍යාප්තියක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. බස්නාහිර පළාතේ ජන සංඛ්‍යාව වැඩිවීමට බලපාන හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ග්‍රාමීය ජනාවාස සහ නාගරික ජනාවාස පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. i. වියළි කලාපීය භූ දර්ශනයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ ජීවත්වන මිනිසුන්ගේ මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. (a) පරිසරයට සිදුකරන අහිතකර මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(b) එම මානුෂ ක්‍රියාකාරකම් නිසා ඇතිවන අහිතකර බලපෑම් තුනක් ලියන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 09 | විෂයය / பாடம் / Subject භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper I, II | පිළිතුරු පත්‍රය |

## I - පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. ආසියා | 6. නි | 11. සමෝච්ච | 16. 2 |
| 2. 103 | 7. නි | 12. ජපානය | 17. 3 |
| 3. වයඹ | 8. වැ | 13. සාක්ෂරතාව | 18. 4 |
| 4. වියළි | 9. වැ | 14. ඒක ශීර්ෂ | 19. 1 |
| 5. ආනවිලුන්දාව | 10. නි | 15. ඕසෝන් | 20. 1 |

(ලකුණු 2 × 20 - 40)

## II - පත්‍රය

1. (අ) 1. B 2. E 3. G 4. M 5. N (ලකුණු 2 × 5 - 10)

(ආ) නියමිත සංකේත හා වර්ණ භාවිතා කර ඇද තිබේ නම් ලකුණු දෙන්න. (ලකුණු 2 × 5 - 10)

2. i. හොවැංහෝ, අමුර් (ලකුණු 02)

ii. එවරස්ට්, කන්චන්ජුන්ගා, මකාලු, ධවලගිරි, මනස්ලු, නන්ගාපාබට්, අන්නපූර්ණා, නන්දාදේවි මින් තුනක් (ලකුණු 03)

iii. ශාක වර්ග:- පයින්, ස්ප්‍රෘස්, ෆර්, ඕක්, ලාච් මින් ශාක දෙකක් නම් කිරීම.

- හිම පතනයට ඔරොත්තු දෙන ලෙස සකස් වී තිබීම
- ශාක හේතු රූපාකාර හැඩක් ගැනීම
- ශාක පත්‍ර ඉදිකටු තුඩු වැනි හැඩයක් ගැනීම, මෙවැනි ලක්ෂණ කෙටියෙන් විස්තර කිරීම.

(ලකුණු 2 × 3 = 6)

3. i. ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, පාකිස්ථානය, ශ්‍රී ලංකාව, අරාබි රටවල් මින් රටවල් දෙකක් ලිවීමට (ලකුණු 02)

ii. චික් පී, ඇෆ්රිකට්, කපු, උක්, සහල්, අඹ, කිරි නිෂ්පාදන, ඩේට් පාම්, ලූණු, තිරිඟු, දොඩම් වර්ග මින් තුනක් ලිවීම (ලකුණු 03)

iii. ඩුබායි ආර්ථිකයේ පදනම පෙට්‍රෝලියම් නිෂ්පාදනයයි. ආර්ථිකයේ වැඩිම ප්‍රතිශත වටිනාකම සේවා අංශයයි. සේවා කර්මාන්ත රාශියක් තිබේ. ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය ජෙබිල් අලි වරාය වේ. මෙවැනි කරුණු ඇසුරින් විස්තර කිරීම. (ලකුණු 05)

4. i. මහනුවර, හැටන්, වැලිමඩ, මහවලතැන්න, කොස්ලන්ද මෙම සානුවලින් දෙකක් ලිවීමට (ලකුණු 02)

ii. 2 - පහතරට වියළි කලාපය
3 - කඳුකර තෙත් කලාපය
5 - අර්ධ ශුෂ්ක කලාපය (ලකුණු 03)

iii. (a) පහත රට තෙත් කලාපය නම් කිරීමට (ලකුණු 02)
(b) පහත රට තෙත් කලාපයේ ලක්ෂණ
- ● නිරිත දිග තැනිතලා ප්‍රදේශයට අයත් ය.
- ● වාර්ෂික වර්ෂාපතනය 2000m වේ.
- ● වාර්ෂික උෂ්ණත්වය 27º ක් පමණ වේ.
- ● නිරිතදිග මෝසමෙන් වැසි ලැබේ.
- ● අවුරුද්ද මුළුල්ලේම වර්ෂාව පවතී. ලක්ෂණ තුනක් ලිවීමට (ලකුණු 03)

5. i. සංවහන වර්ෂාව, මෝසම් වර්ෂාව, වාසුළි වර්ෂාව මින් දෙකක් ලිවීම. (ලකුණු 02)

ii. ඉන්දියානු උප මහාද්වීපයට ආසන්නව පිහිටීම
- උන්නතාංශය
- මුහුදේ සිට ඇති දුර
- වෙනස්වන සුළං රටාව මෙවැනි සාධක තුනක් ලිවීම (ලකුණු 03)

iii. (a) වගුරු බිම්, බොකු, කලපු, තුඩු, දූපත්, වෙරළදඹ ඩෙල්ටා මින් හූ ලක්ෂණ දෙකක් නම් කිරීමට (ලකුණු 02)
(b) ඉහත ලියා ඇති භූ ලක්ෂණයක් විස්තර කිරීමට (ලකුණු 03)

6. i. මොනරාගල, වවුනියාව, මන්නාරම, මුලතිව් මින් දිස්ත්‍රික්ක දෙකක් ලිවීමට (ලකුණු 02)

ii. පරිපාලනමය හා වාණිජමය කටයුතු සංකේන්ද්‍ර ගත වීම කර්මාන්ත, ප්‍රවාහන, අධ්‍යාපන සෞඛ්‍ය සේවා ආදී පහසුකම් මින් තුනක් ලිවීමට (ලකුණු 03)

iii. ග්‍රාමීය ජනාවාසයක් හා නාගරික ජනාවාසයක් පිළිබද ලියා ඇති සරල විස්තරයකට ලකුණු දෙන්න. (ලකුණු 05)

7. i. වී වගාව, හේන් වගාව, කෘෂිකාර්මික කටයුතු වැව් ආශ්‍රිතව බිහිවූ ගම්මාන මින් දෙකක් ලිවීමට (ලකුණු 02)

ii. ධීවර කර්මාන්තය, කොහු කර්මාන්තය, හුණු ගල් කර්මාන්තය, ලුණු කර්මාන්තය, සංචාරක කර්මාන්තය මින් තුනක් ලිවීමට (ලකුණු 03)

iii. (a) පරිසරයට සිදුකරන අහිතකර මානුෂ ක්‍රියාකාරකම් දෙකක් නිවැරදිව ලිවීමට (ලකුණු 02)
(b) එම මානුෂ ක්‍රියාකාරකම් නිසා ඇතිවන අහිතකර බලපෑම් තුනක් ලිවීමට (ලකුණු 03)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න